සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/01/Circular | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2024.04.25 |

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂවරුන් වෙත.

**වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා**
**හිඟ දායක මුදල් අයකිරීමේ දී ඊට අදාළව පොළිය අය කළ යුතු ආකාරය**

ඉහත කරුණට අදාළව නිකුත් කළ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක Pen/pol/06/11-2023 හා 2024.04.02 දිනැති 01/2024 විශ්‍රාම වැටුප් උපදෙස් ලිපිය හා බැඳේ. (අදාළ ලිපියේ පිටපතක් අමුණමි)

02. ඒ අනුව, සමෘද්ධි පනතේ 44 (ඉ) ii වගන්තිය යටතේ මෙම දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන් විසින් අතීත සේවා කාලයට ගෙවිය යුතු හිඟ වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් තවදුරටත් ගෙවිය යුතු නිලධාරීන් ඉහත ලිපියේ උපදෙස් අනුව ගණනය කර ගෙවීම් කිරීමට උපදෙස් ලබාදෙන මෙන් කාරුණිකව දැනුම් දෙමි. 2023.06..01 දිනට පෙර අතීත සේවා කාලයකට අදාළව හිඟ වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අය කිරීමේ දී විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2008 හි විධිවිධාන අනුව 4% ක සුළු පොළියක් පමණක් අය කිරීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් දැනුම් දෙමි.

සී. ඩී. කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:
1. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. විගණකාධිපති - කා.දැ.ගැ.ස.
3. අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
4. ප්‍රධාන ගණකාධිකාරී - දැ.ගැ.ස. හා අ.ක.ස.
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැ.ගැ.ස.
6. සියළුම අංශ ප්‍රධානීන් - නිලධාරීන් දැනුවත් කිරීම සඳහා
7. සියළුම වෘත්තීය සංගම් ලේකම්වරුන් - අ.ක.ස.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය        தலைமுறையொன்றின் பெருமிதம்        Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } Pen/Pol/06/11-2023    ඔබේ අංකය / உமது இல. / Your No. } ..........    දිනය / திகதி / Date } 2024.04.02

05 APR 2024

08 APR 2024

**විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි :- 01/2024**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

පළාත් පාලන ආයතන ප්‍රධානීන්

**වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් අයකිරීමේ දී ඊට අදාළව පොළිය අය කළ යුතු ආකාරය**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2008.01.30 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2008 හා 2023.06.01 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2008 (සංශෝධන I) කෙරෙහි කාරුණික අවධානය යොමු කරවමි.

02. 2023.06.01 දිනට පෙර කාලසීමාවන්ට අදාළව වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් අයකිරීමේ දී විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2008 හි විධිවිධාන අනුව 4%ක සුළු පොළිය අය කිරීමට කටයුතු කළ යුතු ය.

03. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2008 (සංශෝධන I) හි විධිවිධාන 2023.06.01 දින සිට බලාත්මක වීම සිදු වන බැවින්, එදින සිට වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා හිඟ දායක මුදල් අයකිරීමේ දී විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2008 (සංශෝධන I) හි විධිවිධාන අනුව 4%ක වැල් පොළිය අය කිරීමට කටයුතු කළ යුතු ය.

04. 2023.06.01 දිනට පෙර කාල සීමාවකට අදාළ හිඟ දායක මුදලක් 2023.06.01 දිනෙන් පසුව අය කර ගනු ලබන්නේ නම් ඒ සඳහා අය කළ යුත්තේ 4%ක සුළු පොළියකි. ඒ අනුව අය කළ යුතු පොළිය, හිඟ දායක මුදල අදාළ වන කාලසීමාව අනුව තීරණය කළ යුතු ය.

**ජී. ජගත් ඩී. ඩයස්**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත :- ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය } ඔබගේ Pns/P5/08/19 හා 2024.02.28 දිනැති ලිපිය පරිදි කරු. දැ.ගැ.ස.

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.

Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk